# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 ඔක්තෝබර්**


**02 වෙළුම 10 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 848ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 13.2කින් පහත වැටුණි.

2020 වසරේ ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,363ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 24.9කින් පහත වැටුණි.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 16.7කින් පහළ ගිය අතර, ආනයන වියදම ද සියයට 19.9කින් පහළ ගියේය.

වෙළඳ හිඟය 2019 ඔක්තෝබර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 838ට සාපේක්ෂව 2020 ඔක්තෝබර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 514ක් දක්වා අඩු විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2020 ජන. - ඔක්.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ඔක්.)




### අපනයන පරිමා දර්ශකය - (ජන. - ඔක්.)





සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී අපනයන ආදායම පහත වැටුණි.


සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමා පහළ යෑම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී අපනයන පරිමා දර්ශකය පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)




### තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ වෙන්දේසි මිල ගණන් නොමැත.




2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණු අතර තේ, මුහුදු ආහාර, සහ සකස් නොකළ දුම්කොළ අපනයන පහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී කාර්මික අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පහළ යෑම එයට හේතු විය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ඔක්.)





### ආනයන පරිමා දර්ශකය (ජන. - ඔක්.)





2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී ආනයන වියදම පහත වැටුණු අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම එයට හේතු විය. මේ අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආනයන පරිමා දර්ශකය පහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. - ඔක්.)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ
සාමාන්‍ය ආනයන මිල ගණන්





2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී පෞද්ගලික රථවාහන, රෙදිපිළි හා උපාංග, ගෘහ උපකරණ, රබර් නිෂ්පාදිත සහ ගෘහ හා දැව භාණ්ඩ ඇතුළු ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. ආහාර හා පාන වර්ග උප කාණ්ඩය යටතේ වර්ග කර ඇති පාන වර්ග, පලතුරු සහ මුහුදු ආහාර ආනයන වියදම ද පහළ ගියේය.

## අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - ඔක්.)





බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන්
(මාසික සාමාන්‍ය අගයන්)





ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ මූල ලෝහ ආනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී තිරිඟු හා ඉරිඟු, ආහාර සැකසුම්, කෘෂිකාර්මික යෙදවුම් සහ සකස් නොකළ දුම්කොළ ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - ඔක්.)




සියලු ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම හේතුවෙන් 2020 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ඔක්. - 19 | ඔක්. - 20 | වෙනස (%) | ජන. -ඔක්. 2019 | ජන. - ඔක්. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **210.2** | **211.4** | **0.6** | **2,079.1** | **1,949.9** | **-6.2** |
| එයින් | තේ | 113.8 | 112.2 | -1.4 | 1,139.1 | 1,031.8 | -9.4 |
| | පොල් | 26.3 | 32.5 | 23.7 | 284.8 | 289.8 | 1.8 |
| | කුළුබඩු | 32.6 | 33.6 | 3.0 | 267.4 | 266.7 | -0.3 |
| | මුහුදු ආහාර | 19.2 | 15.6 | -18.9 | 219.6 | 165.0 | -24.9 |
| **කාර්මික අපනයන** | | **762.1** | **633.3** | **-16.9** | **7,839.8** | **6,313.2** | **-19.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 441.6 | 358.2 | -18.9 | 4,628.4 | 3,645.0 | -21.2 |
| | රබර් නිෂ්පාදිත | 70.3 | 77.9 | 10.8 | 732.5 | 644.8 | -12.0 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 41.5 | 24.4 | -41.3 | 409.3 | 321.1 | -21.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.7 | 39.1 | 1.0 | 376.0 | 387.7 | 3.1 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 33.4 | 20.8 | -37.9 | 341.4 | 266.1 | -22.1 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 30.0 | 10.4 | -65.3 | 254.6 | 133.3 | -47.6 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.0 | 3.0 | -57.3 | 89.2 | 47.0 | -47.3 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.0** | **3.8** | **-24.6** | **42.3** | **30.3** | **-28.3** |
| **මුළු අපනයන** | | **977.3** | **848.4** | **-13.2** | **9,961.3** | **8,293.4** | **-16.7** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ඔක්. - 19 | ඔක්. - 20 | වෙනස (%) | ජන. -ඔක්. 2019 | ජන. - ඔක්. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **383.3** | **251.6** | **-34.4** | **3,195.3** | **2,818.4** | **-11.8** |
| ආහාර හා පාන වර්ග | | 128.9 | 122.8 | -4.7 | 1,138.2 | 1,271.7 | 11.7 |
| එයින් | එළවළු (අ) | 29.6 | 17.6 | -40.7 | 237.2 | 280.1 | 18.1 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 254.4 | 128.7 | -49.4 | 2,057.1 | 1,546.7 | -24.8 |
| එයින් | පෞද්ගලික රථවාහන | 84.6 | 0.5 | -99.4 | 651.0 | 281.9 | -56.7 |
| **අන්තර් භාණ්ඩ** | | **1,040.2** | **817.5** | **-21.4** | **9,420.7** | **7,393.2** | **-21.5** |
| එයින් | ඉන්ධන | 308.3 | 223.4 | -27.5 | 3,238.8 | 2,128.6 | -34.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 277.1 | 218.1 | -21.3 | 2,404.2 | 1,883.6 | -21.7 |
| | පොහොර | 27.4 | 22.5 | -18.1 | 194.9 | 161.5 | -17.1 |
| | තිරිඟු හා ඉරිඟු | 33.0 | 24.1 | -27.1 | 266.9 | 314.1 | 17.7 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **392.2** | **293.7** | **-25.1** | **3,795.8** | **2,933.3** | **-22.7** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 218.2 | 183.0 | -16.1 | 2,034.9 | 1,764.7 | -13.3 |
| **මුළු ආනයන** | | **1,815.7** | **1,362.8** | **-24.9** | **16,411.8** | **13,145.0** | **-19.9** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ඔක්. - 19 | ඔක්. - 20 | වෙනස (%) | ජන. -ඔක්. 2019 | ජන. - ඔක්. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ ශේෂය | -838.4 | -514.3 | | -6,450.5 | -4,851.6 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | ඔක්. - 19 | ඔක්. - 20 | වෙනස (%) | ජන. -ඔක්. 2019 | ජන. - ඔක්. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| අපනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.0 | 118.1 | -13.2 | 138.6 | 115.4 | -16.7 |
| | පරිමා දර්ශකය | 145.5 | 141.4 | -2.8 | 144.6 | 129.9 | -10.2 |
| | මිල දර්ශකය | 93.5 | 83.5 | -10.6 | 95.8 | 88.8 | -7.3 |
| ආනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 162.5 | 122.0 | -24.9 | 146.9 | 117.6 | -19.9 |
| | පරිමා දර්ශකය | 192.3 | 168.0 | -12.6 | 162.0 | 144.1 | -11.1 |
| | මිල දර්ශකය | 84.5 | 72.6 | -14.1 | 90.6 | 81.6 | -9.9 |
| වෙළඳ මිල අනුපාතය | | 110.6 | 115.1 | 4.0 | 105.7 | 108.8 | 2.9 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද